# අ

අද අ - යන්න කියවන වා

අකුරු කීම අරඹන වා

අකුරෙන් අකුරට යන වා

(c) Sumitha Publishers

අනාගතය සරු වෙන වා

අ අ අ

මගේ නම : ......................

# අ

අපෙ අම්මයි අප්පච්චියි
අපේ අලුත් අවුරුද්දට
අපෙ අත්තයි අත්තම්මයි
බලන්ට යති අපේ ගමට

අයියා අක්කා අඬ ගහ ගෙන
අල්ලා ගෙන නංගි මල්ලි
අතිරහ අලුවා අර ගෙන
අපි යන්නෙමු අපේ ගමට

(c) Sumitha Publishers



# ඇ

පොඩි රවුමක් අඳින වා
ඇදට ඉරක් යොදන වා
තව රවුමක් බාගෙට ඇඳ
උඩට ඉරක් අඳින වා

(c) Sumitha Publishers

# ආ

ආච්චි අපට ආදරෙයි
ආච්චිට අපි ආදරෙයි
ආකාසේ විතර උසට
ආච්චිට අපි ආදරෙයි

ආච්චි කතා කියනවා
ආසාවෙන් අහනවා
ආයුස තව වැඩි වන්නට
ආයුබෝවන් කියනවා

(c) Sumitha Publishers

